සියළුම හිමිකම් ඇවිරිණි
All Right Reserved

බ /විශාඛා බාලිකා මධ්‍ය මහා විද්‍යාලය- බණ්ඩාරවෙල
B/ Vishaka Balika M.M.V- Bandarawela

පළමු වාර පරීක්ෂණය - 2020

| සිංහල භාෂාව හා සාහිත්‍යය | 10 ශ්‍රේණිය | කාලය : පැය 03 යි. |
|---|---|---|

## I – කොටස

- **ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.**

1)

i. අර්ධානුනාසිකාය අක්ෂර දෙකක් ලියන්න.
(අ) (ආ)

ii. විසර්ගය සහිත වචනයක් ලියා අර්ථවත් වාක්‍යයක් නම් කරන්න.
(අ) (ආ)

iii. මිහිඳු හිමිගේ ලංකා ගමනය කිනම් සියවසක සිදුවූයේද?

iv. පහත පදවල විරුද්ධාර්ථ පද ලියන්න.
(අ) ජන ශූන්‍ය (ආ) සශ්‍රීක

v. මොණරාගල භාෂාවේ පහත වචනවල අර්ථ දක්වන්න.
(අ) සකලයෝ (ආ) කුදහව්වා

vi. ජාතක පොත ඇසුරින් රචිත ගී කාව්‍ය දෙකක් නම් කරන්න.

vii. (අ)පන්සිය පනස් ජාතක පොත සඳහා මූලාශ්‍ර කොටගත් ග්‍රන්ථය කුමක්ද?
(ආ) එහි ඇතුළත් දීර්ඝතම කතාව කුමක්ද?

viii. "කොළ වහා මේ නුවර ඒ ඒ දිගින් අඟල මැඩ.............
(අ) මෙසේ පැවසුවේ කවරෙක්ද? (ආ) කුමන අවස්ථාවේදීද?

ix. "මමහ කැවුම් ගෙන කපුටු රැසක් පළවන එකක්හු මෙන්ද දුන්නක් අල්ලාගෙන වදුරු මුලක් .............."
(අ) මෙසේ ප්‍රකාශ කරන්නේ කවරෙක්ද?
(ආ) කාටද? පැවසීමට හේතුව කුමක්ද?

x. මම එබස් අසා රජකු බොළඳ නියා යැයි නින්දා කළෙමි.
(අ)මෙය ප්‍රකාශ කරන ලද්දේ කවුරුන්ද?
(ආ) මේ ප්‍රකාශය ඇතුළත් ග්‍රන්ථය රචනා කරන ලද්දේ කුමන යුගයේදීද?

( ලකුණු 20)

2) පහත දැක්වෙන ප්‍රශ්න වලට කෙටි පිළිතුරු සපයන්න.

i. මපුතනුවක් මහෞෂධ පන්ඩිතයෙන් විනා අනෙක් මා මේ දුකින් මුදන්නට සමර්ථ කෙනෙක් නැතැයි සිතා,

1. මෙය කුමන අවස්ථාවක හා සම්බන්ධ වේද?
2. මෙම පාඨය උපුටා ගත් මුල් ග්‍රන්ථය රචනා කිරීමට අනුග්‍රහය දැක්වූයේ කුමන ඇමතිවරයාද?

ii. ගිරා පණ්ඩිතයන්ගේ මෙබඳු **වතෙක්** ඇත්තේය. ඉදින් කිසි කෙනෙකින් ගෙනා **හස්නක්** පණ්ඩිතයන් වහන්සේට කිය යුතු වී නම් ...........

1. ගිරා පණ්ඩිතයෝ ගෙනා හස්න කුමක්ද?
2. අංකිත පදවල තේරුම ලියන්න.

iii. "දේවයන් වහන්සි ඍද්ධිමත් කෙනෙකුන් ආකාශයෙන් ගොසින් වදුන් මුත් මිනිසුන් විසින් මේ නුවර වදනා තබා සිතන්නටත් බැරිය. "

1. ඍද්ධිමත් කෙනෙකුන්ට පමණක් යා හැකි වන්නේ කොහාටද?
2. එයට හේතුව කුමක්ද?

iv. "එබස් අසා **දණ්ඩෙන්** ගසන ලද **ආශිර්විෂයක්හු** මෙන් ක්‍රෝධයෙන් දිලි කිපුණාහුය.

1. ඉහත පාඨයට අනුව ක්‍රෝධයෙන් දිලිනුනෙත් කවුරුන්ද?
2. අංකිත පදවල තේරුම ලියන්න.

v. "ඒ අභිමතාර්ථ සාධක වූ චින්තක මානිකායක් බඳු වූ මාගේ ස්වාමි දරු වූ බෝධිසත්වයන් වහන්සේ ඒ මල් දඩු මුලින් උදුරුවන......

1. මෙය ක-මන අවස්ථාවක් හා සම්බන්ධ වේද?
2. මෙහි ඇති උපමාවක් ලියා දක්වන්න.

( ලකුණු 25 )

3) පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරා වචන 250 කට නො අඩු රදනාවක් ලියන්න.
( මාතෘකාවක් ද යොදන්න. )

(අ)

"කියවීම සම්පූර්ණ මිනිසකු බිහි කරයි. " යනු කියවීමේ වටිනාකම පිළිබිඹු කෙරෙන ප්‍රකට අදහසකි. එහෙයින් රූපවාහිනී, අන්තර්ජාල වැනි නවීන විද්‍යුත් මාධ්‍ය භාවිතය නිසා පාසල් සිසුන්ගේ කියවීමේ පුරුද්ද සීඝ්‍රයෙන් පහල බැස ඇති බවට ම'ත පළ වී තිබ්. පාසැල් සිසුන්ගේ කියවීමේ රුචිය වර්ධනය කළ හැකි ක්‍රම හා උපාය පිළිබඳව වගකිව යුත්තන්ගේ අවධානය යොමු විය යුතුයි.

(ආ)

පැරණි ගැමි ජනතාව තම විවිධ වෘත්තීන්හි නියැලෙද්දී තම පාළුව, මහන්සිය, කාංසිය මගහරවා ගැනීම සඳහා තම මුවින් ඉබේම නිකුත් වූ කවියක් ගයන්නට පුරුදුව සිටියහ. සිසුන්ගේ නිදහස් සිතුවිලි මනින තම ජීවිතයේ විවිධ අංශ විසිතුරු ලෙස විවරණය කරයි. අපේ සාහිත්‍යයේ ඉදිරි ගමනට ජනශ්‍රැති මඟින් ලැබිය හැකි ආහාෂය අතිමහත්ය.

(ඉ)

පරිසරය විනාශ කිරීම මානව වර්ගයා නසා ගැනීමකි. සියලු සත්තවයනි පමණක් නොව විශ්වයම විනාශ කර ගැනීමකි. පරිසර විනාශය නිසා දිනෙන් දිනට ජනතාවට එල්ලවෙන බලපෑම අකති මහත්ය. මේ තත්තවය ඇති කිරීමට මග පැදුවෙත් මිනිසාමය. දැන්වත් මේ ගැන සිතා බැලිය යුතු කාලය එළඹ ඇත.

(ඊ)

ශ්‍රී ලංකාවේ සිදුවන රිය අනතුරු ප්‍රමාණය දිනෙන් දින ඉහළ යමින් පවතී. මහා මාර්ග පද්ධතියේ අඩුපාඩු මෙන්ම රියදුරන්ගේ සහ පදිකයන්ගේ නොසැලකිමිලත් බව රිය අනතුරු බහුල වීමට බලපාන ප්‍රධාන හේතු සාධක වශයෙන් හඳුනාගෙන තිබේ. නීති රීති මෙන්ම රියදුරන්ගේ හා පදිකයන්ගේ කැපවීම ද රිය අනතුරු වළක්වා ගැනීමට බෙහෙවින් වැදගත් වේ.

( ලකුණු 25 )

4) පහත දැක්වෙන ජේදය කියවා අසා ඇති ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.

ඉන්දියාවේ මෙන්ම පැරණි ලංකාවේ ද ඉතාම පැරණි දේශීය කාසි වර්ගය වූයේ "පුරාණ" නැමති කාසියයි. ග්රේන් 56 ක බරක් තිබුණ සෘජුකෝණාශ්‍රාකාර රිදී කැබැල්ලක් වූ මෙහි දෙපැත්තේම නොයෙක් ලකුණු ඔබ්බවා තිබුණි. රජුගේ අවසරය ඇතිව වෙළඳ ශ්‍රේණි මඟින් නිකුත් කරන්නට ඇතැයි සැළකේ. සංස්කෘත භාෂාවෙන් කර්ෂාපණ ලෙස ද පාලියෙහි කතාපණ යනුවෙන් ද මේ කාසි සඳහන් වේ. පසුකළ මේ වර්ගයේ සමහර කාසි වටකුරු විය. මේවා ක්‍රි.ව. දෙවන ශත වර්ෂය දක්වා භාවිතා විය. ලංකාවේ සොයාගනු ලැබූ මේ වර්ගයේ කාසි උතුරු ඉන්දියාවෙන් ගෙන්වන ලදැයි සිතිය හැකිය. එහෙත් සංකේත පිළිවෙල කර තිබෙන ආකාරයෙන් පෙනෙන්නේ සමහර කාසි ලංකාවේම සාදන ලද බවය.

සළකුණු ඔබ්බවා තිබෙන කාසි කාසි ළඟට ඇති වූයේ මුද්‍රා සිත කාසිය කලින් කළ කාසි තුළ ඔබ්බනු ලැබූ සළකුණු මෙහි දී ඒකාබද්ධ කර ගන්නා ලදී. මුලදී මුද්‍රා යොදන ලද්දේ එක් පැත්තක පමණී. යටි පැත්ත හිස්ව තිබුණේය. නැතහොත් ලකුණු ඔබ්බවා තිබුණේය.

i. "පුරණ " නම් කාසි වර්ගය නිකුත් කරන ලද්දේ කවුරුන් දැයි මෙහි අනුමාන කර ඇතිද?
ii. මුද්‍රා කාසි ඊට පෙර පැවති කාසි වර්ගයට දක්වන සම්බන්ධය කවරේද?
iii. "පුරාණ " නැමැති කාසියේ අංග ලක්ෂණ කවරේද?
iv. පුරාණ කාසි වර්ගය හැඳින්වීමට මෙහි යෙදී ඇති පර්යේෂණ වචන ලියන්න.
v. "කහපණ " භාවිතා වූ වසර ලියන්න.

( ලකුණු 15 )

5) දීර්ඝ කාලයක් තිස්සේ උග්‍ර පානීය ජල හිඟයකින් පෙළුණු ඔබ ප්‍රදේශයට නළ ජල ව්‍යාපෘතියක අවශ්‍යතාවය පවතී. ග්‍රාම සංවර්ධන සමිතියේ ලේකම් ප්‍රසන්න වඩුගේ ඔබ යැයි සිතා මෙම ජල යෝජනා ක්‍රමයේ අවශ්‍යතාව පැහැදිලි කරමින් ප්‍රාදේශීය සභාවේ සබාපති තුමාට ඉදිරිපත් කිරම සඳහා සුදුසු ලිපියක් සකස් කරන්න.

( ලකුණු 15 )